අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

| | | |
|---|---|---|
| මගේ යොමුව / எனது குறியீடு / My Ref. — PTF/01/Circular/01 | ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref. | දිනය / திகதி / Date — 2020.11.30 |

චක්‍රලේඛ අංක: PTF/03/2020(VII)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් වෙත**

**උද්ගතවී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා පීඩාවට පත්වූ පවුල්වලට සහ නිරෝධායනයට යොමු කළ පවුල්වලට සහන සැලසීම.**

උක්ත කරුණ පිළිබඳව මවිසින් නිකුත්කළ අංක PTF/03/2020(VI) හා 2020.11.02 දින දරන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් **දින14කට වඩා වැඩි කාලයක්** හුදකලා කර ඇති ප්‍රදේශ වල ජීවත් වන පවුල් ඒකක සඳහා සහ **දින14කට වඩා වැඩි කාලයක්** නිවාස තුළම නිරෝධායනය වන (Home Quarantine) පවුල් ඒකක සඳහා නැවතත් රු.10,000ක් වටිනා වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මල්ලක් ලබා දෙන ලෙස එම පවුල් විසින් කරනු ලබන දැඩි ඉල්ලීම් සලකා බලා එම ඉල්ලීම ඉටු කිරීමට, 2020.11.27 දින ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවැති රැස්වීමේදී තීරණය විය. එය එකවර හෝ අවශ්‍ය නම් රු. 5,000ක් වටිනා බඩුමලු 02ක් ලෙසට ද ලබා දිය හැකිය.

03. එහිදී, පහත දැක්වෙන නිර්ණායක හා ක්‍රමවේද අනුගමනය කරමින් රු. 10,000ක් වටිනා ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මල්ල ලබා දීමට මෙහිදී හැකියාව ඇත.

- පළමු දින 14 ඉක්මවා නිරෝධායනයට ලක් කරනු ලබන පවුල් ඒකක සඳහා අදාළ සෞඛ්‍ය බලධාරීන්ගේ නිර්දේශය මත අමතරව, නිරෝධායනය වන කාලසීමාව එක් සතියක් සඳහා රු.5000 බැගින් වටිනාකමින් යුත් ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මලු ලබා දීම.

- හුදකලා කරනු ලබන ප්‍රදේශවල ( Lockdown Area) ඇති මහල් නිවාසවල ජීවත්වන පවුල් ඒකක සඳහා ඔවුන්ගේ ජීවනෝපායන් අහිමිවීම සලකා, අදාළ සෞඛ්‍ය බලධාරීන්ගේ නිර්දේශය මත එක් සතියක් සඳහා රු 5,000 බැගින් වටිනා ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මලු, හුදකලා කර තබන සම්පූර්ණ කාලසීමාව සඳහාම සතියකට වරක් ලබා දීම.

- පොලිස් බල ප්‍රදේශ සම්පූර්ණයෙන්ම හුදකලා කිරීම හේතුවෙන් ස්වයංක්‍රීයව දොරගුළු අගුළුලෑමකට ලක්වන නාගරික වතු ආශ්‍රිත පවුල් ඒකක වලට සහ අඩු ආදායම් ලාභී පවුල් වලට එක් සතියක් සඳහා, අදාළ සෞඛ්‍ය බලධාරීන්ගේ නිර්දේශය මත රු. 5000 බැගින් වටිනාකමින් යුත් වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු බඩුමලු හුදකලා කරනු ලබන සම්පූර්ණ කාලසීමාව සඳහාම සතියකට වරක් ලබා දීම.

දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මෙම කටයුතු මෙහෙය වියයුතු අතර අවශ්‍ය නම් ඒ සඳහා ආරක්ෂක අංශවල සහාය ද ලබා ගත හැකිය.

**ගාමිණී එස්.සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
4. ලේකම්,අභ්‍යන්තර ආරක්ෂක,ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
5. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
6. විගණකාධිපති
7. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
8. යුද හමුදාපති
9. පොලිස්පති